සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගණිතය - 3 ශ්‍රේණිය / තෙවන වාරය - සැප්තැම්බර් මාසය - දෙවන සතිය

සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

ටී.ඩබ්.නිපුන් කාවින්ද ලීලාරත්න - ර/පුස්සැල්ල මහා විද්‍යාලය

## 26 ඒකකය - සංඛ්‍යා 4

01. ආදරණීය දුවේ පුතේ මෙම ක්‍රියාකාරකම සිදු කිරීමට පහත සඳහන් ආකාරයට ඉලක්කම් දෙකේ සංඛ්‍යාපත් කට්ටලයක් සකස් කර ගන්න. (කාඩ්පත් 10ක් පමණ)

| 15 | 23 | 45 | 18 | 36 | 77 | 83 | 64 | 90 | 59 |
|---|---|---|---|---|---|---|---|---|---|

- ➢ සකස් කර ගත් සංඛ්‍යා කාඩ්පත් මුණින් අතට හරවා මේසයක් මත තබා ගන්න.
- ➢ පළමු ව සංඛ්‍යා කාඩ්පත් දෙකක් ගන්න. එම සංඛ්‍යා දෙකෙන් කුඩා සංඛ්‍යාව සහ විශාල සංඛ්‍යාව හඳුනා ගෙන ප්‍රකාශ කරන්න.
- ➢ එම සංඛ්‍යා දෙක පහත අයුරින් අභ්‍යාස පොතේ ලියන්න.

උදාහරණ :-

| කුඩා සංඛ්‍යාව | විශාල සංඛ්‍යාව |
|---|---|
| 18 | 64 |
| 36 | 77 |

- ➢ (කාඩ්පත් අවසන් වන තෙක් හෝ කාඩ්පත් නැවත මාරු කරමින් මෙම ක්‍රියාකාරකම සිදු කළ හැකිය)

02. ඉහත ක්‍රියාකාරකම සිදු කළ ආකාරයට ම ඉලක්කම් තුනේ සංඛ්‍යාපත් කට්ටලයක් සකස් කර ගෙන කුඩා ම සහ විශාල ම සංඛ්‍යාව සොයා ප්‍රකාශ කර, එම සංඛ්‍යා ද ඉහත ආකාරයට වගු ගත කරන්න.

03. ඔබ විසින් පෙර සිදු කළ ක්‍රියාකාරකම සඳහා සකස් කර ගත් ඉලක්කම් තුනේ සංඛ්‍යා කාඩ්පත් කට්ටලය මෙම ක්‍රියාකාරකම සඳහා ද යොදා ගත හැකිය.

- ➢ පළමු ව කැමති ඕනෑම සංඛ්‍යා කාඩ්පත් 3ක් ගන්න. ඉන් පසු එම කාඩ්පත් කුඩා සංඛ්‍යාවේ සිට විශාල සංඛ්‍යාව දක්වා අනුපිළිවෙළට සකස් කරන්න.

උදාහරණ :-

| 15 | 23 | 45 |
|---|---|---|

- ➢ ඔබ විසින් ඉහත ආකාරයට කුඩා සංඛ්‍යාවේ සිට විශාල සංඛ්‍යාව තෙක් සකස් කරන ලද සංඛ්‍යා අභ්‍යාස පොතේ ලියන්න.
- ➢ මේ ආකාරයට සංඛ්‍යා කාඩ්පත් මාරු කරමින් ක්‍රියාකාරකම සිදු කරන්න.

04. විශාල ම සංඛ්‍යාවේ සිට කුඩා ම සංඛ්‍යාව තෙක් අනුපිළිවෙළින් ලියන්න.

i. 336, 358, 240, ⟶ ………………………………………………………

ii. 463, 583, 372, ⟶ ………………………………………………………

iii. 758, 473, 641, ⟶ ………………………………………………………

iv. 560, 660, 600, ⟶ ………………………………………………………

v. 789, 799, 779, ⟶ ………………………………………………………

05. ගණිතය වැඩපොතේ පිටු අංක 42, 43 පිටුවල ඇති අභ්‍යාස සිදු කරන්න.